## ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2018

-----------------------------------------------------------------------------

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්යසාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිපත් කළ යුතුය. එම පනතේ 38(1)(ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය. එසේ වුවද, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව, ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

### 2. විගණන නිරීක්ෂණ

----------------------

### (අ) නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකූල නොවීම.

-----------------------------------------------------------------

| නීති රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 39(1) උපවගන්තිය | අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් කිරීමට කටයුතු කරනු ලැබේ. | පනත ප්‍රකාරව ශාස්ත්‍රීය මණ්ඩලයක් පත් කළ යුතු බව |
| (ii) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | වර්තමානයේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙල කළ යුතු බව |
| (iii) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාල ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| (iv) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1 (iii) වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු දරන නිලධාරීන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දිය හැකි වුවත්, ආයතනයේ කණ්ඩායම් ප්‍රවාහනයේ යෙදෙන නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (v) 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස ණයගැති හා ණයහිමිකාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණය සහ පැරණි, යල්පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (vi) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------- | | | |
| • මුදල් රෙගුලාසි 371(2)(ආ) සහ 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ගණන්දීමේ නිලධාරියකු විසින් අතුරු අග්‍රිමයක් දිය යුත්තේ කිසියම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් වුවද, ඊට පටහැනිව අවස්ථා 24 කදී ඊට වැඩි මුදලක් අත්තිකාරම් ලෙස ලබා දී තිබුණි. | ඉදිරියේදී අත්තිකාරම් මුදල් සීමාව ඉහල දැමීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන, ඉන්පසු නිසි පරිදි කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| • මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදිය යුතු අතර නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත නැවත අග්‍රිමය පියවිය යුතුය. එසේ වුවද, අවස්ථා 21 කදී ලබා දී තිබුණු රු.5,000 ක සිට රු.200,000 දක්වා වූ පරාසයක තත්කාර්ය අතුරු අග්‍රිමය පියවීම සඳහා දින 05 ක සිට දින 213 ක් දක්වා වූ කාලපරාසයක් ගතකර තිබුණි. අත්තිකාරම් ගෙවීමේදී එම අත්තිකාරම් මුදල ලබාගත් මුදල් වර්ෂයේ අවසාන දිනට පෙර පියවීමට කටයුතු කලයුතු වුවත්, අවස්ථා 06 | ඉදිරියේදී මෙම තත්ත්වය හැකිතාක් වලක්වා ගැනීමට කටයුතු කරන බව හා නියමිත කාලය තුල නොපියවන තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගත් නිලධාරින් සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

| | | | |
|---|---|---|---|
| | කදී ලබා දුන් එකතුව රු.403,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | | |
| • මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඇතත් ඊට අදාළ වාර්තා විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 දින දක්වාම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව |

**(ආ) කළමනාකරණ ක්‍රියාකාරකම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු. මිලියන 5 ක් වෙන් කර තිබුණු නමුත්, වර්ෂය තුලදී ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් 9 ක් සඳහා වර්ෂය තුලදී සියයට 50 කට අඩුවෙන් මුදල් උපයෝජනය කර තිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී මෙම අඩු ලුහුඩුකම් වළක්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව කටයුතු කළ යුතු බව |
| (ii) සංචාරක සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට ජාතික වෘත්තීය සුදුසුකම (NVQ), ලබාගැනීම සඳහා උපදේශකත්වය හා සහායන් ලබා දුන්නද ආයතනය මේ දක්වා ජාතික වෘත්තීය සුදුසුකම සහිතව පාඨමාලා හඳුන්වා දීමට කටයුතු කර තිබුණි. | ජාතික වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියවිලි සකස් කිරීම අවසන් අදියරට පැමිණ ඇත. ඉදිරි වර්ෂවලදී එම අරමුණ සපුරා ගැනීමට බලාපොරොත්තු වේ. | ජාතික වෘත්තීය සුදුසුකම ලබාගැනීම කළ යුතු බව |
| (iii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය නොකර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය ගෘහස්ථ මල්පෝච්චි ලබා ගැනීම වෙනුවෙන් 2014 වර්ෂයේ මැයි මස සිට 2019 සැප්තැම්බර් මාසය දක්වා රු. 2,049,350 ක මුදලක් වැය කර තිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කල බව තහවුරු කිරීම සඳහා ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කළ යුතු බව |

| | | |
|---|---|---|
| (iv) ආයතනය තම පරිහරණය සඳහා යොදාගෙන තිබුණු වාහනයක නීත්‍යානුකූල හිමිකාරීත්වය තම ආයතනය නමින් පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනය පවරා ගැනීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශයෙන් උපදෙස් විමසා ඇත. | වාහන නීත්‍යානුකූල හිමිකාරීත්වය පවරා ගැනීම කළ යුතු බව |

**(ඇ) මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමුද්‍රා හෝටලයේ වර්ෂය තුල ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර රාත්‍රී (Room Nights) 3285 පවතින අතර එයින් ආයතනයට ආදායම් ලබා ගැනීමට යොදා ගතහැකි වූයේ හෝටල් කාමර රාත්‍රී 762 ක් හෙවත් සියයට 23 ක් පමණි. | ඉදිරියේදී සමුද්‍රා හෝටලයේ පහසුකම් වැඩි දියුණු කිරීම හරහා පාරිභෝගිකයන් ආකර්ශනය කර ගැනීමට කටයුතු යොදා ඇත. | ආදායම් වැඩි කිරීමට කටයුතු කල යුතු බව |

**(ඇ) කාර්ය මණ්ඩල කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 217 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 193 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ 24 ක පුරප්පාඩු සංඛ්‍යාවක් නිරීක්ෂණය විය. | පුවත්පත් දැන්වීම් පලකර ලිඛිත පරීක්ෂණ පවත්වා තනතුරු කිහිපයක් බඳවා ගැනීම සඳහා දැනට කටයුතු කර ඇති අතර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතු බව |

**(ඉ) වාර්ෂික වාර්තා සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් 2014 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා 2019 නොවැම්බර් 30 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වසර කිහිපයකට අදාල වාර්ෂික වාර්තා මේ වන විට සකස් කරමින් පවතී. ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව |